---

**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 02 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 21 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 නොවැම්බර් 27 දින සභාවේ සභාපතිවරයාට යවන ලදී.

### 1.2 මතය.

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව නොච්චියාගම ප්‍රාදේශිය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම වලට අනුකුලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ .

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් කර්මාන්ත 14 ක් සඳහා කරන ලද ගෙවීම් වලින් අත රඳවාගත් රු. 1,360,877 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදි පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණු ඉඩම් කැබලි 24 ක රු.2,018,693 ක් වූ වටිනාකම ගිණුම්ගත කර තිබුණු අතර සභා බල ප්‍රදේශය තුල පිහිටි සුසාන භූමි 04 ක අයිතිය සභාවට පවරාගෙන ඇතත් ඒවායේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳු ගිණුම්

ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගි ලේඛන වල දැක්වෙන ශේෂයන් අතර රු. 127,609 ක වෙනසක් දැක්වුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.38,977,806 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවු ආදායම රු. 4,430,562 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවු පුනරාවර්තන වියදම රු. 929,472 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

1988 ප්‍රාදේශිය සභා ( මූල්‍ය හා පරිපාලන ) රීති 180 ප්‍රකාරව මුදල් හෝ ගබඩා භාරව කටයුතු කරන නිලධාරින් හෝ ආදායම් සම්බන්ධව රාජකාරි ඉටුකරන නිලධාරින් විසින් ඇප තැන්පත් කර නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i). | වරිපනම් හා බදු | 1,768 | 901 | 3,275 |
| (ii). | බදු කුලී | 4,931 | 398 | 4,891 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 1,310 | 2,628 | 168 |
| (iv). | වෙනත් ආදායම් | 16,306 | 5,853 | - |

### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 925,171 |
| (ii) | මුද්දර ගාස්තු | 465,140 |

### 2.3.3 අක්කර බදු

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134(3) වගන්තිය පරිදි සභා සීමාව තුල පිහිටියා වූ ඉඩම් මත අක්කර බද්දක් පනවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.4 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

ප්‍රධාන අමාත්‍යාංශයෙන් 2008 වර්ෂයේදි ලැබුණු රු. 814,000 ක් වටිනාකම වූ සහල්පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන කට්ටලය හා ඒ සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරිම සහ වෙනත් පොදු කාර්යය වියදම් වශයෙන් රු.1,750,836 ක් වැයකර තිබුණ ද අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.5 ආර්ථික නොවූ ගනුදෙනු**

සභාවට අයත් පැරණි ගොඩනැගිල්ල විධිමත් කුලී ගිවිසුමකින් තොරව රජයේ දෙපාර්තමේන්තුවකට වර්ෂ කිහිපයකට පෙර සිට ලබාදී තිබුණු අතර ඒ සඳහා කිසිදු කුලියක් ලබා නොගෙන තිබියදී වර්ෂ 05 ක විදුලි බිල්පත් සඳහා රු.125,464 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

**2.6 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) ඡේදයේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුලදී ආගමික කටයුතු සඳහා දරන ලද රු.50,000 ක් වූ වියදම් සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**2.7 සභාව විසින් ආරම්භ කර ඇති නෛතික කටයුතු**

එකතුව රු.1,224,300 ක් වූ කඩ කුලී නොගෙවීම සම්බන්ධයෙන් බදුකරුවන් 04 කට එරෙහිව සභාව විසින් අනුරාධපුර දිසා අධිකරණයේ නඩු 04 ක් ගොනු කර තිබුණි. එසේ වුවද එම කඩ කාමර වල අයිතිය පිළිබඳ ගැටළුවක් හේතුවෙන් නෛතික කටයුතු වලට සහභාගී වීමෙන් වැලකී සිටිමට සභාව තීරණය කර තිබුණි.

**2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සංයුක්ත සැලැස්මට හා ක්‍රියාකාරි සැලැස්මට අනුරූපීව අයවැය ලේඛණය විධිමත්ව සකස් කර නොතිබුණු හෙයින් අයවැයගත හා තත්‍ය අගයන් අතර ප්‍රමාණාත්මක විචලතාවයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේදි සභාව විසින් අනුමත කාර්ය මණ්ඩලය ඉක්ම වූ සේවකයන් 35 දෙනෙකු සේවයේ යොදවා ප්‍රතිපූර්ණය නොවන වැටුප් වශයෙන් රු.3,887,673 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ඈ) වසරකට වැඩි කලක සිට අයවීමට ඇති සේවක ණය රු.1,008,400 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වසරකට වැඩි කලක සිට ගෙවිය යුතුව පවතින ණයහිමි ශේෂ එකතුව රු.21,909,477 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල පළාත් සභා විමධ්‍යගත සංවර්ධන ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කිරිම සඳහා එකතුව රු.232,070 ක ප්‍රතිපාදන ලැබී තිබුණ ද එම කර්මාන්ත ආරම්භ කිරිමට කටයුතු කර නොතිබුණු අතර සභාව මගින් ක්‍රියාත්මක කිරිමට අනුමත වී තිබුණු පිරිවැය රු.485,000 ක් වූ කර්මාන්ත 03 ක් අත්හැර දමා තිබුණි.

2.9 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේදි සභාව විසින් පරිසර හිතකාමි කසල කළමනාකරණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

03. **පද්ධති හා පාලන.**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) මානව සම්පත් කළමනාකරණය